සියලුම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது
All rights Reserved

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
நீதி மற்றும் தேசிய ஒருமைப்பாடு அமைச்சு
Ministry of Justice and National Integration

දිවුරුම්දුන් භාෂා පරිවර්තකයන් පත්කිරීම සඳහා වන විභාගය - 2024
சத்தியபிரமாணம் செய்த மொழிபெயர்ப்பாளர்களை நியமிப்பதற்கான பரீட்சை - 2024
Examination for the Appointment of Sworn Translators – 2024

පරිවර්තනය (සිංහල/ඉංග්‍රීසි)
மொழிபெயர்ப்பு (சிங்களம் / ஆங்கிலம்)
Translation (Sinhala/English)

කාලය පැය: 1 ½
நேரம்: 1 ½ மணித்தியாலம்
Time: 1 ½ Hours

මුළු ලකුණු 100
மொத்தப் புள்ளிகள்: 100
Full Marks 100

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
எல்லா வினாக்களுக்கும் விடையளிக்குக.
Answer all the Questions.

**1.** **ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන්න.**

**ආර්ථික අර්බුදය හේතුවෙන් ධීවර කර්මාන්තයට ඇති වී තිබෙන බලපෑම අවම කර, ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ වැඩසටහන**

ඉන්ධන මිල ගණන් ඉතා විශාල ලෙස ඉහළ යාම හේතුවෙන් ධීවර කර්මාන්තයට සිදුවන අහිතර බලපෑමට පිළියම් යෙදීම සඳහා 2024-08-21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබුණ ද, එම තීරණය මේ දක්වා ක්‍රියාත්මක වී නොමැත. එබැවින්, ධීවර කාර්මිකයින්ගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කර ගෙන 2024-10-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස 06ක කාලයක් සඳහා පහත සඳහන් සහන ලබා දීම පිණිස කෘෂිකර්ම, ඉඩම්, පශුසම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

ඉන්ධන වශයෙන් ඩීසල් ලබාගන්නා ධීවර යාත්‍රා හිමියන් සඳහා ඔවුන් විසින් ලබාගනු ලබන එක් ඩීසල් ලීටරයකට රුපියල් 25/-ක මුදලක් ලැබෙන සේ මසකට රුපියල් 300,000/-ක් දක්වා වන උපරිමයකට යටත්ව "ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ දීමනාවක්" ලබා දීම.

ඉන්ධන වශයෙන් භූමිතෙල් ලබාගන්නා යාත්‍රා හිමියන් සඳහා දිනකට භූමිතෙල් ලීටර 15ක හා මසකට දින 25ක උපරිමයකට යටත්ව, රැකියාවේ නිරත වන දිනයන් සඳහා පමණක් සීමා වන පරිදි භූමිතෙල් ලීටරයකට රුපියල් 25/-ක "ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ දීමනාවක්" ලබා දීම.

(ලකුණු 25)

**2. ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන්න.**

**අනුමැතිය අපේක්ෂාවෙන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් නොකළ යුතු කරුණු :**

I. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි හෝ නියෝග, ප්‍රකාශන, නීති/අනුනීති හෝ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීති, ජාතික පොලිස් කොමිෂන් සභාවේ මග පෙන්වීම්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ආදිය ඇතුළත්ව වෙනත් යම් ආනුෂාංගික නීතියක විධිවිධාන පරිදි වෙනත් බල්ධාරීන් වෙත පැවරී ඇති විෂයයන්ට අදාළ වන යෝජනා (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කෙරුණු 13 වන සංශෝධනයේ නව වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ සඳහන් විෂයයන්ද ඇතුළත්ව).

II. අමාත්‍ය මණ්ඩලය විසින් වෙනත් බලධාරින් වෙත පවරා දී ඇති විෂයයන්ට අදාළ කරුණු.

III. අධිකරණයක් ඉදිරියේ විභාග වන නීති කෘත්‍යයක් පවතින අවස්ථාවකදී එම විෂයයට අදාළ යෝජනා. (කෙසේ වෙතත් අදාළ පාර්ශ්වයන් අතර සමථයකට/එකඟතාවකට එළඹීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු වේ.)

(ලකුණු 25)

**3. Translate into Sinhala.**

**Issues in respect of the language proficiency to be acquired by certain other services:**

- **Librarians' Service**

The level of proficiency recommended for the Librarians' Service, who assist those seeking information on books written in both Sinhala and Tamil languages, is the minimum level of language proficiency expected from employees of minor grades. The Committee, however, was of the view that since the possession of a higher language proficiency by this category would facilitate a more efficient delivery of service to those who expect their assistance, it would be appropriate to apply a higher level of proficiency to the Librarians' Service than the one stipulated for them at present.

- **Sri Lanka Ayurveda Medical Service**

According to Public Administration Circular No.07/2007, the proficiency level – 3 is applicable to Government Medical Officers and Dental Medical Officers. However, no provisions have been made with regard to the Ayurveda Medical Officers in the said Circular. Since the Sri Lanka Ayurveda Medical Officers, too, work with various communities throughout the country, the Committee observed that it would be appropriate to assign the proficiency level – 3 currently applicable to the Government Medical Officers, to the Ayurveda Medical Service, as well.

(25 Marks)

4. Translate into Sinhala.

**COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUTION**

(I) Parliament shall by law provide for the establishment of a Commission to investigate allegations of bribery or corruption. Such law shall provide for –

(a) the appointments of the members of the Commission by the President on the recommendation of the Constitutional Council.

(b) the powers of the Commission, including the power to direct the holding of a preliminary inquiry or the making of an investigation into an allegation of bribery or corruption, whether of its own motion or on a complaint made to it, and the power to institute prosecutions for offences under the law in force relating to bribery or corruption; and

(c) measures to implement the United Nations Convention Against Corruption and any other International Convention relating to the prevention of corruption, to which Sri Lanka is a party.

(25 Marks)